# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT

# 2011

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**இலங்கை சனநாயக சோசலிசக் குடியரசின்**

**அரசாங்க சேவை ஆணைக்குழு**

**PUBLIC SERVICE COMMISSION**
**OF**
**THE DEMOCRATIC SOCIALIST REPUBLIC**
**OF SRI LANKA**

# රාජ්‍ය සේවා කොමිෂන් සභාව

# වාර්ෂික වාර්තාව

# 2011


**177 , නාවල පාර**

**නාරාහේන්පිට**

**කොළඹ 05**

දුරකථන - **0112-136600 / 0112-136650 / 0112-136700**

ෆැක්ස් - **0112-369302 / 0112-369305**

ඊ මේල් - **secretary@psc.gov.lk**

වෙබ් - **www.psc.gov.lk**

මගේ අංකය: PSC/ADM/06/02/05/2011

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය

177, නාවල පාර

නාරාහේන්පිට

කොළඹ 05

2013 ජනවාරි මස 10 දින.

මහ ලේකම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

මහත්මයාණෙනි

**<u>2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා</u>**

**<u>කාලපරිච්ඡේදය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (5) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව මේ සමඟ ඔබ වෙත එවමි.

මෙයට - විශ්වාසී

ටී.එම්.එල්.සී. සේනාරත්න

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## දැක්ම

සමානාත්මතා ගුණය පෙරදැරිව, යුක්ති සහගතව, විනිවිදභාවයෙන් යුක්තව හා තිරසාරව මහජනතාවට සේවය කරන්නාවූ ද, දූෂිතභාවය, දේශපාලනීකරණය, නාස්තිය, අනවධානය හා අලසභාවය වැනි සියළු නිෂේධ බලපෑම්වලින් තොරව ප්‍රජාතන්ත්‍රවාදී පාලනය කෙරෙහි සාධනීය අයුරින් සහයවන්නාවූ ද, කාර්යක්ෂම, විනයගරුක හා තෘප්තිමත් රාජ්‍ය සේවයක් ප්‍රවර්ධනය කිරීම සහ එයට සහය වීම.

## මෙහෙවර

කොමිෂන් සභාවේ මෙහෙවර වනුයේ, ජනතා සේවයට කැපවූ පරිනත, කාර්යක්ෂම, අපක්ෂපාතී හා අතිශයින් අභිප්‍රේරිත රාජ්‍ය නිලධාරී මඩුල්ලක් ස්ථාපනය කර පවත්වාගෙන යනු ලැබීමය.

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්

### සභාපති

විද්‍යාජෝති වෛද්‍ය දයාසිරි ප්‍රනාන්දු මහතා

### සාමාජිකයන්

ජනාධිපති නීතිඥ පාලිත එම්. කුමාරසිංහ මහතා

සිරිමාවෝ ඒ. විජේරත්න මහත්මිය

එස්.සී. මාන්නප්පෙරුම මහතා

ආනන්ද සෙනවිරත්න මහතා

එන්.එච්. පතිරණ මහතා

එස්. තිල්ලෙයිනඩරාජා මහතා

එම්.ඩී.ඩබ්ලිව්. ආරියවංශ මහතා

ඒ. මොහොමඩ් නහියා මහතා

# පටුන


| අනු අංකය | කාරණය | | පිටු අංකය |
|---|---|---|---|
| **1** | **හැඳින්වීම** | | 01 |
| **2** | **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඓතිහාසික ගමන් මග** | | 01 |
| **3** | **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල** | | 03 |
| | 3.1 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ විමසුමට ලක්කල හැකි අවස්ථා | 03 |
| **4** | **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ පොදු සමාලෝචනය** | | 03 |
| | 4.1 | ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාව සමඟ කටයුතු කිරීම | 04 |
| | 4.2 | මානව හිමිකම් උල්ලංඝනය වීම සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කර ඇති නඩු සම්බන්ධව ක්‍රියා කිරීම | 04 |
| | 4.3 | උතුරු නැගෙනහිර ප්‍රදේශ සඳහා විශේෂ බඳවා ගැනීම් | 04 |
| | 4.4 | පත්කිරීම් හා උසස්කිරීම් | 05 |
| | 4.5 | විනය කටයුතු | 07 |
| | 4.6 | අභියාචනා | 07 |
| | 4.7 | පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය සමඟ කටයුතු කිරීම | 08 |
| | 4.8 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්ථාපනය වීමත් සමඟ ඇතිවූ කාර්යාල කටයුතු යථාවත් කර ගැනීමේදී ඇතිවූ දුෂ්කරතා මග හරවා ගැනීම | 08 |
| | 4.9 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද කාර්ය පටිපාටික රීති | 09 |
| | 4.10 | රාජ්‍ය ආයතන දැනුවත් කිරීම | 09 |
| **5** | **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යසාධනය වර්ධනය කිරීම සඳහා ගන්නා ලද තීරණයන්** | | 09 |
| | 5.1 | රාජ්‍ය නිලධාරීන් පත් කිරීම්, උසස් කිරීම්, ස්ථානමාරු කිරීම් හා විනය පාලනයට අදාල කටයුතු ප්‍රමාදයකින් තොරව ඉටුකිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු බලතල උචිත පරිදි අමාත්‍යාංශ ලේකම්වරුන්ට හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට පැවරීම | 09 |
| | 5.2 | සේවාලාභීන්ට වඩාත් සුහදශීලී සේවයක් සැපයීම | 10 |
| | 5.3 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳ තොරතුරු මහජනතාවට හා රජයේ සේවකයින්ට ලබා දීම | 10 |
| | 5.4 | රාජ්‍ය ආයතන සමඟ කටයුතු කිරීමේදී සුහදශීලී අන්‍යෝන්‍ය සබඳතාවක් ඇතිකර ගැනීම | 10 |
| | 5.5 | කාර්යාල කටයුතු විධිමත් හා කාර්යක්ෂමව කිරීමට පරිගණක ජාලයක් ස්ථාපිත කිරීම | 11 |
| | 5.6 | තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම | 11 |
| | 5.7 | නවීන පහසුකම් වලින් යුත් දුරකථන ජාලයක් ස්ථාපිත කිරීම | 12 |
| | 5.8 | තොරතුරු තාක්ෂණ කටයුතු විධිමත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ඒකකයක් පිහිටුවීම | 12 |
| **6** | **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ ප්‍රධාන අංශ වල කාර්යසාධනය** | | 12 |
| | 6.1 | ආයතන අංශය | 12 |
| | 6.1.1 | ආයතන අංශයේ කාර්යභාරය | 13 |

පටුන


| | | | |
|---|---|---|---|
| | 6.1.2 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක නොවූ 2011-01-01 දින සිට 2011-05-12 දින දක්වා කාලය තුළ ඉටු කරන ලද කාර්යයන් | 14 |
| | 6.1.3 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක වූ 2011-05-13 දින සිට 2011-12-31 දින දක්වා කාලය තුළ ප්‍රගති සමාලෝචනය | 15 |
| | 6.1.4 | කාර්යක්ෂම හා සඵලදායී සේවයක් සැපයීම වෙනුවෙන් ගනු ලැබූ නව ක්‍රියා මාර්ග | 16 |
| | 6.2 | පත්කිරීම් හා උසස් කිරීම් අංශය | 16 |
| | 6.2.1 | පත්කිරීම් හා උසස් කිරීම් අංශයේ කාර්යභාරය | 17 |
| | 6.2.2 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක නොවූ 2011-01-01 දින සිට 2011-05-12 දින දක්වා කාලය තුළ ඉටු කරන ලද කාර්යභාරය | 18 |
| | 6.2.3 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක වූ 2011-05-13 දින සිට 2011-12-31 දින දක්වා කාලය තුළ ප්‍රගති සමාලෝචනය | 18 |
| | 6.2.4 | කාර්යක්ෂම හා සඵලදායී සේවයක් සැපයීම වෙනුවෙන් ගනු ලැබූ නව ක්‍රියා මාර්ග | 19 |
| | 6.3 | විනය අංශය | 20 |
| | 6.3.1 | විනය අංශයේ කාර්යභාරය | 21 |
| | 6.3.2 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක නොවූ 2011-01-01 දින සිට 2011-05-12 දින දක්වා කාලය තුළ ඉටු කරන ලද කාර්යයන් | 22 |
| | 6.3.3 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක වූ 2011-05-13 දින සිට 2011-12-31 දින දක්වා කාලය තුළ ප්‍රගති සමාලෝචනය | 23 |
| | 6.3.4 | කාර්යක්ෂම හා සඵලදායී සේවයක් සැපයීම වෙනුවෙන් ගනු ලැබූ නව ක්‍රියා මාර්ග | 24 |
| | 6.4 | **අභියාචනා අංශය** | 25 |
| | 6.4.1 | අභියාචනා අංශයේ කාර්යභාරය | 26 |
| | 6.4.2 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක නොවූ 2011-01-01 දින සිට 2011-05-12 දින දක්වා කාලය තුළ ඉටු කරන ලද කාර්යයන් | 26 |
| | 6.4.3 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක වූ 2011-05-13 දින සිට 2011-12-31 දින දක්වා කාලය තුළ ප්‍රගති සමාලෝචනය | 27 |
| | 6.4.4 | කාර්යක්ෂම හා සඵලදායී සේවයක් සැපයීම වෙනුවෙන් ගනු ලැබූ නව ක්‍රියා මාර්ග | 28 |
| | 6.5 | පාලන අංශය | 29 |
| | 6.6 | ගිණුම් අංශය | 29 |
| **7** | **මුදල් ප්‍රතිපාදනය** | | 30 |
| **8** | **කාර්ය මණ්ඩලය** | | 30 |
| | 8.1 | සංවිධාන සටහන | 30 |
| | 8.2 | කාර්ය මණ්ඩලය | 31 |
| | 8.3 | කාර්ය මණ්ඩල පුහුණු කටයුතු | 31 |
| **9** | **2011 වර්ෂය තුල එක් එක් අංශ විසින් කරුණු ඉදිරිපත් කර ඇති නඩු ගණන** | | 32 |
| **10** | **කොමිෂන් සභා රැස්වීම්** | | 33 |
| **11** | **ස්තුතිය** | | 33 |

## 01. හැඳින්වීම

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් සංශෝධිත 54(1) අනු ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුට නොවැඩි සාමාජිකයින් සංඛ්‍යාවකගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වේ. ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ. 2011.05.13 දින සිට මෙම කොමිෂන් සභාව පත් කරනු ලැබ ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(5) අනු ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2011 ජනවාරි 01 වන දින සිට 2011 දෙසැම්බර් 31 වන දින දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරයි.

## 02. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඓතිහාසික ගමන් මග

ශ්‍රී ලංකාව, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක්ව පැවති සමයේ දී, වර්ෂ 1946 මැයි මස 15 දිනැති ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාව මඟින් ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදි. එමඟින්, රාජ්‍ය නිලධාරීන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරුකිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම් පිළිබඳ විධායක බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරා දෙන ලදි.

වර්ෂ 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව සම්මත වීමත් සමඟ, එතෙක් වසර විසි හයක් පුරා ක්‍රියාත්මක වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව අහෝසි වූ අතර රාජ්‍ය සේවය පිළිබඳ අධිකාරි බලය අමාත්‍ය මණ්ඩලය වෙත පවරා දෙනු ලැබිණ.

වර්ෂ 1978 දී දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව ප්‍රතිෂ්ඨාපනය කරන ලද අතර, එම කොමිෂන් සභාව සඳහා සාමාජිකයන් පත් කිරීම උක්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56(1) වන අනු ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් සිදුකරනු ලැබිය. අමාත්‍ය මණ්ඩලයේ අභිනියෝජිත බලය ප්‍රකාරව එම රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක විය.

වර්ෂ 1978 දි, රජයේ නිලධාරීන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථානමාරු, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම් පිළිබඳ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අමාත්‍ය මණ්ඩලය විසින් පවරා දෙනු ලැබිණ. අමාත්‍ය මණ්ඩල නියෝග ප්‍රකාරව, රජයේ නිලධාරීන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථානමාරු, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම පිළිබඳ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත පවරා දෙනු ලැබිණ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව

අභියාචනා බලධරයා වශයෙන් ක්‍රියාත්මක විය. කොමිෂන් සභාව හෝ එමඟින් බලය අභිනියෝජිත කමිටුවක් විසින් ගනු ලබන තීරණ වෙනස් කිරීමට, අමුතු කිරීමට හෝ අවලංගු කිරීමට ඉඩ සැලසෙන බලතල අමාත්‍ය මණ්ඩලය වෙත රඳවා ගනු ලැබිණ.

වර්ෂ 2001 දී, 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින්, රාජ්‍ය සේවය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එතෙක් පැවති IX වන පරිච්ඡේදය පරිච්ඡින්න කොට නව පරිච්ඡේදයක් ඇතුලත් කරන ලදී. ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයන් නව දෙනෙකුට නොවැඩි සාමාජිකයින් සංඛ්‍යාවකගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වූ අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබුණි. මෙම සංශෝධනය මඟින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තත්වය ප්‍රබල වෙනසකට භාජනය වූ අතර, ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව, රාජ්‍ය සේවයේ පත්කිරීම්, උසස්කිරීම්, ස්ථාන මාරු කිරීම හා විනය පාලනය කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී තිබුණු බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරිණි. තවද මෙහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවට වගකීමට හා පිළිතුරු දීමට බැඳී සිටින ආයතනයක් බවට පත්කෙරිණි.

වර්ෂ 2010 දී , 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ස්ථාපනය හා කර්තව්‍යයන්ට අදාළ කරුණු සංශෝධනය කරනු ලැබ ඇත. මෙය පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවට පිළිතුරු දිය යුතු කොමිෂන් සභාවකි. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් සංශෝධිත 54(1) අනු ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වේ. ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ. ඔවුහු තෙවසරක කාල පරිච්ඡේදයක් සඳහා ස්වකීය ධූර හොබවන අතර, තවදුරටත් එවැනි එක් කාල පරිච්ඡේදයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුස්සන් වනු ඇත. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් සංශෝධිත 55(1) අනු ව්‍යවස්ථාව අනුව අමාත්‍ය මණ්ඩලය විසින් රජයේ නිලධරයන්ට අදාළ සියලු ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්විය යුත්තේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව, පොලිස් නිලධාරීන් ද ඇතුළු ව රාජ්‍ය නිලධාරීන් පත්කිරීම, උසස්කිරීම, ස්ථාන මාරුකිරීම හා ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම පිළිබඳ බලතල කොමිෂන් සභාව වෙත පවරා ඇත.

## 03. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල

18 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් පැවරී ඇති බලතල අනුව යුධ හමුදා, නාවික හමුදා හා ගුවන් හමුදා සාමාජිකයන් හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවලින් පත්කරන ලද පළාත් රාජ්‍ය සේවකයින්, ජනාධිපතිවරයා විසින් පත්කරන ලද අමාත්‍යාංශ ලේකම් හා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරන ලද උපලේඛන ගත නිලධාරින් සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල ආයතන සේවකයන්ද හැර පළාත් සභාවල සේවය කරන දීප ව්‍යාප්ත සේවා වලට ගැනෙන නිලධාරීන් සහ අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් ,

- පත්කිරිම
- උසස් කිරිම
- ස්ථාන මාරු කිරිම
- විනය පාලනය හා සේවයෙන් පහ කිරීම , රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබයි.

### 3.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ විමසුමට ලක්කළ හැකි අවස්ථා

පහත සඳහන් අවස්ථාවන්හි දී හැරුණ විට කොමිෂන් සභාවේ තීරණ කිසිදු අධිකරණයකදී හෝ විනිශ්චය සභාවකදී මත විමසුමකට ලක්කළ නොහැකිය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61 අ ව්‍යවස්ථාව අනුව 126 ව්‍යවස්ථාවේ (1) වන, (2) වන, (3) වන, (4) වන හා (5) වන ඡේදයන්හි විධිවිධානයන්ට යටත්ව, මූලික අයිතිවාසිකම් වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පැමිණිලි කිරීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59 (1) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව හා 2002 අංක 4 දරණ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය පනතින් ස්ථාපනය කරන ලද පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනය කිරිම

## 04. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ පොදු සමාලෝචනය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, විනය කටයුතු මෙන්ම ඊට අදාළ අභියාචනා සම්බන්ධයෙන්ද කටයුතු කිරීමේදී යහපාලනය පවත්වා ගැනීම උදෙසා සාධාරණත්වය, සමානාත්මතාවය හා විනිවිදභාවය සුරැකෙන අයුරින් ක්‍රියා කර ඇත.

ඒ අනුව පත්වීම් ලබා දීමේදී ප්‍රසිද්ධ දැන්වීම් පළකර අයදුම්පත් ලබා ගනිමින්ද, උසස්වීම් වලදී ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය පදනම් කරගනිමින්ද, විනය කටයුතු වලදී අවංකභාවය

හා චර්යාධර්ම සුරකිමින්ද, දඬුවම් ලබාදීමේදී සමානරූපී බව රැකෙන අයුරින්ද කටයුතු කර ඇත. එමෙන්ම ස්ථාන මාරු සඳහා නිසි ස්ථාන මාරු පරිපාටි අනුගමනය කිරීමටද කටයුතු කර ඇත. මෙම අරමුණු මුදුන් පත් කර ගැනීම සඳහා මෙකී කාර්යයන් සම්බන්ධයෙන් විධිමත්ව කටයුතු කිරීමට අදාළ ක්‍රියා පරිපාටි හා මාර්ගෝපදේශ අදාළ අමාත්‍යාංශ වලට හා අනෙකුත් ආයතනවලට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දී ඇත.

## 4.1 ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාව සමඟ කටයුතු කිරීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දුන් තීන්දු පිළිබඳව මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් කරන පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කළයුතු ආකාරය පිළිබඳ ගරු කථානායකවරයාගේ ආරාධනයෙන් කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් පාර්ලිමේන්තුවේදී සාකච්ඡාවක් පවත්වන ලද අතර, එහිදී ගැටළු රාශියක් නිරාකරණය කර ගැනීමට හැකි විය. ඒ අනුව විශේෂයෙන්ම ඒ ඒ පෙත්සම්කරුවන්ගේ අභියාචනා සම්බන්ධව කොමිෂන් සභාව තීරණ ගෙන ඇති ආකාරය පිළිබඳව මහජන පෙත්සම් කාරක සභාවට සවිස්තරව කරුණු ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම සඳහා නිලධාරීන් දැනුවත් කර ඇත.

## 4.2 මානව හිමිකම් උල්ලංඝනය වීම සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කර ඇති නඩු සම්බන්ධව ක්‍රියා කිරීම

පත්කිරීම්, උසස් කිරීම් හා විනය කටයුතු සම්බන්ධව අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු සහ අදාළ අනෙකුත් ආයතන විසින් විධිමත් ක්‍රියා පරිපාටි අනුගමනය නොකිරීම යන චෝදනා මත පදනම්ව විශාල නිලධාරීන් සංඛ්‍යාවක් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරා ඇති අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව මෙම වර්ෂය තුළ නඩු 49 ක් සඳහා කරුණු ඉදිරිපත් කර ඇත. මෙම තත්ත්වය වලක්වා ගැනීම සඳහා විශේෂයෙන් පොලිස් දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය මෙම කොමිෂන් සභාව වෙත කිහිපවරක්ම කැඳවා කරුණු පැහැදිලි කර දී ඇත.

## 4.3 උතුරු නැගෙනහිර ප්‍රදේශ සඳහා විශේෂ බඳවා ගැනීම්

කඩිනමින් ක්‍රියාත්මක කරගෙන යනු ලබන රජයේ සංවර්ධන වැඩ පිළිවෙල සඳහා උතුරු නැගෙනහිර ප්‍රදේශ වලට අනුයුක්ත කිරීමට සුදුසු හා ප්‍රමාණවත් නිලධාරීන් නොමැති බව සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට හා ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා

ගැනීම සඳහා සේවා ව්‍යවස්ථා විධි විධානයන්ගෙන් බැහැරව දෙමළ මාධ්‍යයෙන් විශේෂ විභාග පවත්වා බඳවා ගැනීම් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී ඇත.

## 4.4 පත්කිරීම් හා උසස්කිරීම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ඉල්ලීම් වලින් සැලකිය යුතු සංඛ්‍යාවක් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ/ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව ඉදිරිපත් නොකිරීම හා අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් නොකිරීම හෝ එම ලිපිලේඛන වරින් වර ඉදිරිපත් කිරීම නිසා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දීම ප්‍රමාද වී ඇත.

ඇබෑර්තු පිරවීම සඳහා අවශ්‍ය කටයුතු නොකිරීම සහ කාල සටහන් පිළියෙල කර නොතිබීම නිසා රාජ්‍ය සේවයේ තනතුරු රාශියක පුරප්පාඩු ඇතිවී ම නිසා වැඩ බැලීමේ පත්වීම් ලබා දීම සිදුවී ඇත. එවැනි පත්කිරීම් අක්‍රමවත් ලෙස සිදුකර තිබීම නිසා ගැටළු රාශියකට මුහුණ දීමට රජයට සිදුවී ඇත.

පත් කිරීම් හා උසස් කිරීම් සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ වල ප්‍රතිඵල නොපමාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළයුතු වුවත්, එම උපලේඛන රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම, ප්‍රමාද කිරීම, එමෙන්ම එලෙස ඉදිරිපත් කරනු ලබන උපලේඛන වල ලකුණු සංශෝධනය කර තිබීම, ලකුණු සනාථ කිරීමට අදාළ තොරතුරු උපලේඛනයේ සටහන් නොකිරීම හා අදාළ ලිපිලේඛන ඉදිරිපත් නොකිරීම, පත්කිරීම් හා උසස්කිරීම් වලට අදාළ මූලික සුදුසුකම්, සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලා නොතිබීම වැනි ඌනතා හේතුවෙන් ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාදීම ප්‍රමාද වූ අවස්ථා නිරීක්ෂණය වේ.

ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත කරනු ලබන උසස්වීම් වලට අදාළ මූලික කටයුතු පරිපාලන බලධාරීන් විසින් නියමිත කාලය තුල සිදු නොකිරීම හේතුවෙන් සුදුසුකම් ලත් සමහර නිලධාරීන්ට උසස්වීම් නොලබාම සේවයෙන් විශ්‍රාම යාමට සිදුවූ අවස්ථා දක්නට ඇත. එපමණක් නොව අදාළ තනතුරු වල රාජකාරි ආවරණය කරනු ලැබූ හෝ වැඩ බැලීම කරන ලද නිලධාරීන් උසස්වීම් පෙරදාතම් කරන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කරනු ලැබුව ද, පවත්නා පරිපාටික රීති තත්වයන් යටතේ එවැනි පෙරදාතම් කිරීම් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දීමට අසීරු වී ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක නොවූ කාලය තුළ පත්කිරීම් හා උසස්කිරීම් සම්බන්ධයෙන් අදාළ සේවා ව්‍යවස්ථා සහ බඳවා ගැනීම් පටිපාටි විධිවිධානවලට පටහැනි අයුරින් හා අදාල බලධාරීන්ගේ විධිමත් අනුමැතියකින් තොරව ඉල්ලුම්පත් කැඳවා තිබුණු හා විධිමත්ව අනුමත කර නොගත් ලකුණු පරිපාටින්වලට අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබුණු අවස්ථාවන් හිදී අදාළ පත්කිරීම් හා උසස් කිරීම් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාදීම ගැටළු සහගත විය.

රාජ්‍ය සේවයේ පවත්නා පුරප්පාඩු නිසි කලට නොපිරවීම හා විධිමත් ක්‍රමවේදයකින් තොරව නිලධාරීන් අදාළ තනතුරු සඳහා පත්කර තිබීම යන හේතු මත බලය අභිනියෝජනය කරන ලද බලධාරීන් යටතට අයත් වන නිලධාරීන් සැලකිය යුතු සංඛ්‍යාවක් සාධාරණත්වය අපේක්ෂාවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනා ඉදිරිපත් කර ඇති අතර, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ විමසනු ලබන බැවින්, අදාල නිරීක්ෂණ සැපයීමේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාවට විවිධ වූ දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවී ඇත.

බලය අභිනියෝජිත බලධරයන් විසින් බඳවාගැනීම් පරිපාටිවල සඳහන් සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් තාවකාලික පදනමින් හෝ කොන්ත්‍රාත් පදනමින් රාජ්‍ය සේවයට බඳවාගෙන ඔවුන් දීර්ඝ කාලයක් රඳවා තබා ගැනීමෙන් පසුව ඔවුන්ගේ පත්වීම් ස්ථිර කරන ලෙසට ඉල්ලීම් ඉදිරිපත් කිරීම සහ ඔවුන් විශ්‍රාම යාමේ වයසට එළඹී විට එම නිලධාරීන් ස්ථිර කරන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කිරීම, යන ගැටළු වලටද රාජ්‍ය සේවා කොමිෂන් සභාව මුහුණ පෑවේය.

එමෙන්ම, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 ට අනුකූලව රාජ්‍ය සේවයේ නිලධාරීන් සම්බන්ධයෙන් සියලුම සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කළයුතුව ඇති නමුදු, දැනට අනුමත කර ඇත්තේ ඉතාමත් සුළු ප්‍රමාණයක් වන අතර අදාළ අමාත්‍යාංශ විසින් මෙම සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීම් පටිපාටි සකස් කර එවීමේ ප්‍රමාදය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාදීමට ද නොහැකි වී ඇත.

## 4.5 විනය කටයුතු

විනය කරුණක් ආරම්භ කිරීමේ දී අදාළ මූලික විමර්ශනය, ඒ පිළිබඳව මනා දැනුමක් ඇති සුදුසු මූලික විමර්ශන නිලධාරියෙකු යොදා එම කරුණට අදාළ සියළුම තොරතුරු අනාවරණය කර ගත හැකි වන පරිදි නියමිත ක්‍රමවේදයට අනුකූලව නොපැවැත්වීම නිසා සාර්ථක විනය කටයුත්තක් පවත්වා ගෙන යාමේ හැකියාව නොමැති වී ඇත. රාජකාරී වැඩ තහනම් කළ නිලධාරීන් සම්බන්ධයෙන් එයින් පසු අනුගමනය කළ යුතු ඉදිරි විනය ක්‍රියා මාර්ග දිගු කලක් ගත වන තුරු පරිපාලන බලධාරීන් විසින් ආරම්භ කිරීම පමා කිරීම නිසා විනය කටයුත්තක් අවසන් කිරීමට දිගු කලක් ගත වන අවස්ථා පවතී. එසේම විනය කටයුත්තක් ආරම්භ කිරීමේ දී හා එය පවත්වා ගෙන යාමේ දී යම් යම් තීරණ ගැනීමට අවශ්‍ය කරන සියළු තොරතුරු රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත එක වර ලබා නොදීම නිසා ද නිලධාරීන් සම්බන්ධ විනය කටයුතු ආරම්භ කර අවසන් කිරීමට දිගු කලක් ගත වේ.

පරිපාලන බලධාරීන් හා මූලික විමර්ශන නිලධාරීන් විසින් චෝදනා පත්‍ර කෙටුම්පත් කිරීමේ දී විවිධ කරුණු වලට අයත් චෝදනා එකම චෝදනා පත්‍ර කෙටුම්පතකට ගොනු කිරීමට කටයුතු කිරීමෙන් එම කෙටුම්පත් ඉතා සංකීර්ණ වීම සිදුවේ. එම චෝදනා පත්‍ර කෙටුම්පත් සරල චෝදනා පත්‍ර බවට නැවත සකස් කිරීමට සිදු වීමෙන් අමතර කාලයක් හා ශ්‍රමයක් දැරීමට සිදු වී ඇත.

මූලික විමර්ශනයක් අවසානයේදී චෝදනා පත්‍ර කෙටුම්පතක් අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය යන වැරදි පූර්ව නිගමනයක මූලික විමර්ශන නිලධාරීන් බහුතරයක් එළඹ සිටීම නිසා චෝදනා පත්‍ර ගොනු නොකළ යුතු අවස්ථාවන්හි දී පවා කෙටුම්පත් චෝදනා පත්‍ර ඉදිරිපත් කිරීමෙන් අනවශ්‍ය කාලයක් හා ශ්‍රමයක් දැරීමට සිදු වේ.

රාජ්‍ය දේපල පිළිබඳ කරන ලද විෂමාචාරයන් පිළිබඳව සහ රාජ්‍ය නීති උල්ලංඝණය කර ඇති අවස්ථා පිළිබඳව අධිකරණ ක්‍රියා මාර්ග නොගැනීම අදාල බලධාරීන් තම වගකීම ඉටු නොකිරීමක් ලෙස නිරීක්ෂණය වේ. පොලිස් දෙපාර්තමේන්තුව මෙවැනි චෝදනා පිළිබඳ ප්‍රමුඛතාවයක් දී අධිකරණ ක්‍රියාමාර්ග කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම වැදගත්ය.

## 4.6 අභියාචනා

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58(1) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් වන අභියාචනා සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවම වශයෙන් මාස 03 ක කාලයක්

තුළදීවත් දන්වා යවා අදාළ කටයුතු අවසන් කළ යුතුව ඇත. ඒ අනුව කටයුතු කිරීම සඳහා අදාළ දෙපාර්තමේන්තු/ අමාත්‍යාංශ වෙතින් අභියාචනා සම්බන්ධව ඉදිරිපත් කළ යුතු වාර්තා කඩිනමින් නොලැබීම තීරණාත්මක බාධකයක්ව පවතී.

තවද බලය අභිනියෝජිත බලධාරින් විසින් තීරණ ලබා දීමේදී රාජ්‍ය සේවයේ අදාළ නීති හා රෙගුලාසි වලට මනා ලෙස අනුකූලව කටයුතු නොකරන අවස්ථා හා උල්ලංඝනය වී ඇති අවස්ථා නිරීක්ෂණය වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස විෂමාචාරයන් සිදුකළ නිලධාරීන් විනය ක්‍රියා මාර්ගවලට හසු නොවී ඉන් මිදීමට හැකි තත්වයන් උදාකර ගනී. එසේම රජයට සිදුවන අලාභයන් ප්‍රතිපූර්ණය කර ගැනීමට ඇති අවස්ථාද එමගින් මඟ හැරෙන අතර, රාජ්‍ය සේවයේ විනය පවත්වාගැනීමට ද ඉන් බාධා ඇතිවේ. ඒ අනුව අභිනියෝජිත බලය අදාළ විධිවිධානයන්ට අනුකූල වන අයුරින් ක්‍රියාත්මක කිරීමෙන් අනවශ්‍ය ලෙස අභියාචනා ඉදිරිපත් කිරීමේ අවස්ථා අවම වන අතර, අභියාචන බලධාරියා ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය භාරය කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමද තව දුරටත් පහසු කෙරෙනු ඇත.

## 4.7 පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය සමඟ කටයුතු කිරීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද නියමයකට හෝ තීරණයක් සම්බන්ධයෙන් සෑහීමට පත්නොවන රජයේ නිලධාරීන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59 වන ව්‍යවස්ථාව සහ 2002 අංක 4 දරණ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය පනතින් ස්ථාපිත පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත අභියාචනා කිරීමේ අයිතිය ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව ලබාදෙන තීරණ සම්බන්ධව අභියාචනා විනිශ්චය අධිකාරය වෙත කෙරෙන අභියාචනා වලට අදාල නිවැරදි තොරතුරු ඇතුලත් වාර්තා කලට වේලාවට ඉදිරිපත් කිරීම හා නිලධාරීන් විනිශ්චය සභාව ඉදිරියේ පෙනී සිට කරුණු පැහැදිලි කිරීම මගින් අභියාචන විනිශ්චය අධිකාරයට නිවැරදි තීන්දු ලබා දීම සඳහා කොමිෂන් සභාවේ සහයෝගය උපරිම අයුරින් ලබා දී ඇත.

## 4.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්ථාපනය වීමත් සමඟ ඇතිවූ කාර්යාල කටයුතු යථාවත් කර ගැනීමේදී ඇතිවූ දුෂ්කරතා මග හරවා ගැනීම

2011 වර්ෂයේ මැයි මස රාජ්‍ය සේවා කොමිෂන් සභාව නැවත සංස්ථාපනය කිරීමේදී ප්‍රමාණවත් ඉඩකඩ සහිත කාර්යාලයක් හා අවශ්‍ය උපකරණ නොතිබීම, කාර්ය මණ්ඩලයෙන් අඩක් පමණ ස්ථාන මාරුවී තිබීම යනාදී කරුණු හේතුවෙන් කාර්යයන්

විධිමත් පරිදි හා අප්‍රමාදව ඉටුකිරීමට බාධක පැනනැගී තිබුණි. නමුත් වර්ෂය අවසන් වන විට ඵලදායී සේවයක් ලබාදීමට හැකිවන පරිදි අවශ්‍ය කටයුතු සපුරාගෙන ඇත.

## 4.9 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද කාර්ය පටිපාටික රීති

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61 ආ ව්‍යවස්ථාව මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරා ඇති බලය ප්‍රකාරව රජයේ නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම හා ස්ථාන මාරු කිරීම සහ ඒ සම්බන්ධව සහ ඊට අනුශාංගික වන කරුණු පිළිබඳව විධිවිධාන සැලැස්වීම සඳහා කාර්ය පටිපාටික රීති සකස්කර අංක 1589/30 දරණ 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇත. මෙම කාර්ය පටිපාටික රීති යාවත්කාලීන කිරීමේ කටයුතු වර්ෂය තුල ආරම්භ කරන ලදී.

## 4.10 රාජ්‍ය ආයතන දැනුවත් කිරීම

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමඟ කටයුතු කිරීමේ දී පැන නගින ගැටලු, ප්‍රමාදවීම් හා දුෂ්කරතා මග හරවා ගෙන කටයුතු කිරීමට හැකිවන පරිදි අදාළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ගෙන්වා සාකච්ඡා මගින් කරුණු පැහැදිලි කරදී අන්‍යෝන්‍ය වශයෙන් වූ සුහද සබඳතා ඔස්සේ කටයුතු කිරීමට ක්‍රියාකර ඇත.

# 05. <u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යසාධනය වර්ධනය කිරීම සඳහා ගන්නා ලද තීරණයන්</u>

## 5.1 රාජ්‍ය නිලධාරීන් පත් කිරීම්, උසස් කිරීම්, ස්ථානමාරු කිරීම් හා විනය පාලනයට අදාල කටයුතු ප්‍රමාදයකින් තොරව ඉටුකිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු බලතල උචිත පරිදි අමාත්‍යාංශ ලේකම්වරුන්ට හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට පැවරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු බලතල පවරමින් 2011 නොවැම්බර් මස 25 දිනැති අංක 1733/52 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයක් නිකුත් කර 2012.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාල බලතල පවරා දෙනු ලැබ ඇත.

මෙම ගැසට් නිවේදනයට අනුව තෘතියික මට්ටමේ කොටසක් හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගේ පත්වීම් හා විනය බලතල කොමිෂන් සභාව තුළ රඳවාගෙන අනෙකුත් සියලු නිලධාරීන් සම්බන්ධ බලතල අමාත්‍යාංශ ලේකම්වරුන්ට හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට පවරා ඇති අතර එමගින් රාජ්‍ය නිලධාරීන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම් හා විනය පාලනයට අදාළ කටයුතු කඩිනම් කළ හැකිවනු ඇත.

## 5.2 සේවාලාභීන්ට වඩාත් සුහදශීලී සේවයක් සැපයීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් තොරතුරු ලබා ගැනීම, පැමිණිලි කිරීම සහ අභියාචනා ඉදිරිපත් කිරීම සඳහා පැමිණෙන රජයේ නිලධාරීන්ට සහ මහජනතාව සඳහා බදාදා දිනය වෙන් කර ඇත. ඔවුන්ගේ ගැටළු සොයා බලා නිරීක්ෂණය කිරීම සඳහා සහකාර ලේකම්වරයෙකුගේ සේවය ලබා දී ඇත. අදාල පුද්ගලයින්ට භාෂාත්‍රයෙන්ම තොරතුරු ලබා ගැනීමට ආකෘති පත්‍රයක්ද ඔවුන්ට සහය වීම සඳහා සහායක නිලධාරියෙක් ද ලබා දී ඇත. මෙමගින් කොමිෂන් සභාව වෙත පැමිණෙන නිලධාරීන්ට තෘප්තිමත් සේවයක් ලබා දීමට කටයුතු යොදා ඇත.

## 5.3 රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳ තොරතුරු මහජනතාවට හා රජයේ සේවකයින්ට ලබා දීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවිය යථාවත් කර ඇති අතර එමගින් අවශ්‍ය තොරතුරු ලබා දීමට හැකි පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යභාරය , බලතල පැවරීම හා සාමාජික මහත්ම මහත්මීන් සම්බන්ධ තොරතුරු යනාදිය ඊට ඇතුළත් කර ඇත. එයට අමතරව පහත සඳහන් කරුණු ද වෙබ් අඩවියට ඇතුළත් කර ඇත.

( www.psc.gov.lk )

- රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ, ආකෘති පත්‍ර
- එක් එක් අංශ වල කාර්යභාරය සම්බන්ධ තොරතුරු
- කොමිෂන් සභාව විසින් ඒ ඒ අවස්ථා වලදී අනුමත කරන පත්වීම් හා උසස් වීම් සම්බන්ධ තොරතුරු ඇතුලත් කෙරේ.

## 5.4 රාජ්‍ය ආයතන සමඟ කටයුතු කිරීමේදී සුහදශීලී අන්‍යෝන්‍ය සබඳතාවක් ඇතිකර ගැනීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ ගැනීමට අවශ්‍ය වන තොරතුරු සපයා ගැනීමේ ක්‍රියාවලියේදී රාජ්‍ය ආයතන සමඟ සුහදතාවයකින් හා මනා අවබෝධයකින් ක්‍රියා කිරීම

වඩා යහපත් ප්‍රතිචාරයන්ට හේතු වී ඇති අතර එමගින් කටයුතු පහසුවෙන් කර ගැනීමට අවශ්‍ය පසුබිම සැලසී ඇත.

## 5.5 කාර්යාල කටයුතු විධිමත් හා කාර්යක්ෂමව කිරීමට පරිගණක ජාලයක් ස්ථාපිත කිරීම

කාර්යාල කටයුතු වඩාත් විධිමත් කිරීම සඳහා නව තාක්ෂණය යොදා ගැනීම කාලීන අවශ්‍යතාවයක් බැවින් සියළුම මාණ්ඩලික නිලධාරීන් වෙත හා කළමනාකරණ සහකාර සේවයේ ප්‍රමාණවත් නිලධාරී සංඛ්‍යාවකට පරිගණක ලබා දීමට කටයුතු කර ඇත. මාණ්ඩලික නිලධාරීන් වෙත අන්තර් ජාල පහසුකම්ද සපයා ඇති අතර ඕනෑම රාජකාරී කටයුත්තක් සඳහා ඊ මේල් පහසුකම් හරහා ඔවුන් හා සම්බන්ධ විය හැකි වාතාවරණයක් සකස් කර ඇත.

## 5.6 තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යභාරයට අදාලව ලැබෙන සියලුම ලිපි සම්බන්ධ තොරතුරු මෙම පද්ධතියට ඇතුලත් කරනු ලබන අතර, දෛනිකව සියලු අංශ වෙත ලිපි බෙදා හැරීම, එම අංශ වල නිලධාරීන් වෙත රාජකාරි පැවරීම සිදුකිරීම, එම රාජකාරි වලට අදාළ තීරණ ගැනීමේ ක්‍රියාවලි හා සම්බන්ධ මූලික පියවරයන්හි තොරතුරු කළමනාකරණය කිරීමද මෙමගින් සිදු කෙරේ.

ඒ අනුව කාර්යාලය වෙත ලිපි ලැබීමේ ක්‍රියාවලිය නිශ්චිත අයුරින් තහවුරු කරනු ලැබ ඇති අතර, හඳුන්වා දී ඇති ප්‍රතිසංවිධානයන්ට අනුකූලව රාජකාරි පැවරීමේ කටයුතු විධිමත්ව සිදුවේ. මේ අනුව නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීම සහ රාජකාරි අධීක්ෂණය සාර්ථකව සිදුකිරීමට අවශ්‍ය පසුබිම සැකසී ඇත.

තීරණ ගැනීමේ ක්‍රියාවලියේ සෑම මූලික පියවරයක්ම තොරතුරු පද්ධතියට ඇතුළත් වන නිසා රාජ්‍ය සේවකයින් විසින් කරනු ලබන විමසීම් වල දී කඩිනමින් තොරතුරු ලබාදීමට අවස්ථාව සැලසී ඇති අතර, දත්ත වර්ගීකරණය මගින් අවස්ථාවෝචිත පරිදි තීරණ ගැනීමේ ක්‍රියාවලියට වැදගත් වන තොරතුරු ලබාගැනීමට ද, තීරණ ගැනීමේ මුළු ක්‍රියාවලියේම කාර්යසාධනය ඇගයීමට ද මේ අනුව පසුබිම සැකසී ඇත.

## 5.7 නවීන පහසුකම් වලින් යුත් දුරකථන ජාලයක් ස්ථාපිත කිරිම

අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන්ට කඩිනමින් තොරතුරු ලබාගැනීමට හැකිවන පරිදි නවීන පහසුකම් වලින් යුත් දුරකථන ජාලයක් ස්ථාපනය කර ඇත.

## 5.8 තොරතුරු තාක්ෂණ කටයුතු විධිමත් කිරිම සඳහා තොරතුරු තාක්ෂණ ඒකකයක් පිහිටුවීම

කාර්යක්ෂම හා සඵලදායී සේවයක් සපයාදීමේ අරමුණින් ස්ථාපනය කරන ලද පරිගණක ජාලය සක්‍රීයව පවත්වාගෙන යාම සඳහාත්, තොරතුරු තාක්ෂණය කාර්යාල කටයුතු සඳහා මැනවින් යොදා ගැනීම සඳහාත්, තොරතුරු තාක්ෂණ ඒකකයක් පිහිටුවා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරින් යොදවා ඇත. මෙම ඒකකය මඟින් වෙබ් අඩවිය යථාවත් කර පවත්වා ගෙන යාම ද, අභ්‍යන්තර ජාල පද්ධතිය හා අන්තර්ජාල පද්ධතිය කාර්යක්ෂමව පරිශීලනය කිරීමේ පහසුකම් සැලසීම ද, නඩත්තු කටයුතු පවත්වාගෙන යාම ද සිදු කරයි.

# 06. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ ප්‍රධාන අංශ වල කාර්යසාධනය

## 6.1 ආයතන අංශය

ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ආ ව්‍යවස්ථාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයෙන් විධිවිධාන සලසනු ලබන තෙක්, ක්‍රියාත්මක කිරීම ආරම්භ වන දිනයේ දී රාජ්‍ය සේවයට අදාළව බලාත්මකව පැවති සියලු රීති, නියෝග හා කාර්ය පටිපාටි, එම පරිච්ඡේදය යටතේ රාජ්‍ය සේවයට සම්බන්ධව සාදනු ලැබූ හෝ විධිවිධාන සලස්වනු ලැබූ රීති, නියෝග හා කාර්ය පටිපාටි අවශ්‍ය වෙනස් කිරීම් සහිතව බලාත්මකව පවතින ලෙස සැලකිය යුතු බව සඳහන් වී ඇත.

ඒ අනුව රාජ්‍ය සේවයට අදාළ රීති, නියෝග හා කාර්ය පටිපාටි පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙහි නව අංශයක් ලෙස ආයතන අංශය පිහිටුවන ලදි. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ ආයතන අංශය සඳහා අනුමත තනතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| අතිරේක ලේකම් | 01 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 01 |
| සහකාර ලේකම් | 04 |

කළමනාකරණ සහකාර 05

2008.12.15 දින අතිරේක ලේකම් තනතුර සඳහා පත්කිරීම සිදු කරමින් ආයතන අංශය ආරම්භ කරන ලද අතර, ඉන් අනතුරුව වරින් වර කාර්ය මණ්ඩලය අනුයුක්ත කරන ලදි.

## 6.1.1 ආයතන අංශයෙහි කාර්යභාරය

- රාජ්‍ය සේවා කොමිෂන් සභා විෂය පථයට අයත් බලය, වගකීම් සහ බලතල පැවරීමට අදාළ කටයුතු
- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සම්පාදනය, සංශෝධනය හා ප්‍රසිද්ධ කිරීම.
- රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති පදනම් කරගත් උපදෙස් මාලා සකස් කිරීම සහ ඒ සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.
- චක්‍රලේඛ, නියෝග හා උපදෙස් නිකුත් කිරීම.
- රාජ්‍ය සේවයට අදාල සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීම සහ සංශෝධනය කිරීම.
- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි, චක්‍රලේඛ සහ නියෝගවලින් බැහැර වන අවස්ථාවලදී ඒ පිළිබඳ කටයුතු කිරීම.
- කාර්ය පටිපාටික රීති වලට ආවරණය නොවන කරුණු සම්බන්ධව අර්ථ නිරූපණය.
- රාජ්‍ය සේවයට අදාළ දත්ත පද්ධතිය සංවර්ධනය කිරීම, යථාවත් කිරීම, පවත්වා ගෙන යාම සහ තොරතුරු බෙදා හැරීම.
- කාර්යක්ෂමතා කඩඉම් සහ භාෂා ප්‍රවීණතා වලට අදාළ ක්‍රියාදාමයන් හා එම ක්‍රියාදාමවලින් වෙනස් වන අවස්ථාවලට අදාළ කටයුතු.
- රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරු පටිපාටි සකස් කිරීම හා සංශෝධනය කිරීම.
- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා දේශීය හා විදේශීය පුහුණු කිරීමේ කටයුතු මෙහෙයවීම.

## 6.1.2 රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක නොවූ 2011-01-01 දින සිට 2011-05-12 දින දක්වා කාලය තුළ ඉටු කරන ලද කාර්යයන්

ආයතන අංශය වෙතින් ඉටුකරනු ලැබූ මූලික ක්‍රියාකාරකම් වන,

- බඳවාගැනීම් පරිපාටි හා සේවා ව්‍යවස්ථා සකස් කිරීම, පරීක්ෂා කිරීම, සංශෝධනය කිරීම.
- වාර්ෂික ස්ථාන මාරු පරිපාටි සකස් කිරීම, පරීක්ෂා කිරීම හා සංශෝධනය කිරීම.
- කාර්ය පටිපාටික රීතිවලින් ආවරණය නොවන කරුණු සම්බන්ධ රාජකාරි
- දේශීය හා විදේශීය පුහුණුවීම් සම්බන්ධ රාජකාරි වලට අදාළ

පහත දැක්වෙන රාජකාරි ආයතන අංශය විසින් ඉටුකර ඇත.

- රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්කළ වහාම ඉදිරිපත් කිරීම අරමුණු කොටගෙන බඳවාගැනීම් පටිපාටි හා සේවා ව්‍යවස්ථා සකස්කිරීම පිළිබඳ විශේෂ උපදෙස් මාලා කෙටුම්පත අධ්‍යයනය කොට සංශෝධනයන් සිදු කිරීම.

- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 1 කාණ්ඩය සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ නිලධාරීන්ගේ නිරීක්ෂණ ලබාගෙන එහි කළ යුතු සංශෝධන හඳුනාගැනීම.

- රාජ්‍ය සේවා කොමිෂන් සභාව කාර්යක්ෂමතා කඩඉම් සහන ඉල්ලුම් කිරීමේදී තොරතුරු නිවැරදිව හා එකවර ගෙන්වා ගැනීම පහසු කිරීමෙහිලා ආකෘති පත්‍ර හා උපදෙස් මාලාවක් පිළියෙල කිරීම.


- රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්කළ පසු කාර්යක්ෂමව හා නිවැරදිව රාජකාරී ඉටුකරවාගැනීමේ අරමුණින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් හට පුහුණු අවස්ථා ලබාදීමේ ප්‍රමාණය ඉහළ නැංවීම හා ඒ සම්බන්ධ පසුවිපරම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඊට අමතරව අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා පහත සඳහන් දේශීය පුහුණු අවස්ථාවන් ලබාදීම.

### 6.1.3 රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක වූ 2011-05-13 දින සිට 2011-12-31 දින දක්වා කාලය තුළ ප්‍රගති සමාලෝචනය

ඉහත කාල සීමාව තුළ පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී ඇත.

| | කාරණය | එකතුව |
|---|---|---|
| 1 | නව බඳවා ගැනීම් පරිපාටි | 36 |
| 2 | නව සේවා ව්‍යවස්ථා | 2 |
| 3 | බඳවා ගැනීම් පරිපාටි සංශෝධනය | 2 |
| 4 | සේවා ව්‍යවස්ථා සංශෝධනය | 1 |
| 5 | කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධ කරුණු | 31 |
| 6 | ස්ථාන මාරු පරිපාටි | 4 |
| 7 | ශ්‍රේෂ්ඨාධිකරණය,පරි.අභි.විනි.අධිකාරිය,අභියාචනාධිකරණය සම්බන්ධ කරුණු | 5 |
| 8 | චක්‍රලේඛ | 5 |
| 9 | විශේෂ අවස්ථාවන්හිදී බඳවා ගැනීම් පරිපාටි හා සේවා ව්‍යවස්ථා වලින් බැහැර වීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම්. | 30 |
| 10 | ප්‍රතිපත්ති සම්බන්ධ කටයුතු | 61 |
| 11 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වලට අදාල කරුණු | 12 |
| 12 | පොදු කරුණු | 08 |
| 13 | **එකතුව** | **197** |

වගුව අංක 01




රූප සටහන අංක 01

### 6.1.4 කාර්යක්ෂම හා සඵලදායි සේවයක් සැපයීම වෙනුවෙන් ගනු ලැබූ නව ක්‍රියා මාර්ග

කාර්යක්ෂමතා හා භාෂා ප්‍රවීණතා සම්බන්ධ සහන ලබා දෙන ලෙස රජයේ නිලධාරීන්ගේ ඉල්ලීම් මෙම කාර්යාලයට ඉදිරිපත් කරනු ලැබේ. මෙම ඉල්ලීම් සම්බන්ධයෙන් කඩිනම් තීරණ ලබා දීම සඳහා නියමිත ආකෘති පත්‍රයක් හා උපදෙස් මාලාවක් ඇතුළත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2011 චක්‍රලේඛය නිකුත් කිරීමට කටයුතු කරන ලදී.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ඇමුණුම 01 හි 4:3 වගන්තිය අනුව සංශෝධනය කරනු ලබන හා අළුතින් සම්පාදනය කරනු ලබන සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීම් පරිපාටි කෙටුම්පත් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ හා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලබයි. එම කෙටුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ආයතන අධ්‍යක්ෂ ජනරාල් , ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිලධාරීන් ද අදාළ අමාත්‍යාංශ වල නිලධාරීන් ද කැඳවා සාකච්ඡා හා වැඩමුළු පැවැත්වීමට පියවර ගන්නා ලදි. එම පියවරයන් තුළින් කඩිනමින් හා සාර්ථකව නව බඳවා ගැනීම් පරිපාටි හා සේවා ව්‍යවස්ථා සම්බන්ධ කටයුතු ඉටු කිරීමට හැකි විය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 වැනි ව්‍යවස්ථාවේ නියමයන්ට අනුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරනු ලැබ ඇති බලතල අනුව හඳුනාගත් රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම හා සේවයෙන් පහ කිරීම අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි බලතල පැවරීමේ කටයුතු සිදු කරන ලදි. ඒ සම්බන්ධයෙන් අංක 1733/52 හා 2011.11.25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය පළ කිරීමට කටයුතු කරන ලදි.

## 6.2 පත්කිරීම් හා උසස් කිරීම් අංශය

අංක 1733/52 හා 2011.11.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇති අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පවරා නොමැති රාජ්‍ය නිලධාරින් (අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් රාජ්‍ය සේවයේ හා අධිකරණ සේවයේ නිලධාරින් හැර) සම්බන්ධයෙන් වන පත්කිරීම් හා උසස් කිරීම් පිළිබඳ පහත දැක්වෙන කර්තව්‍යයන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පත්කිරීම් හා උසස් කිරීම් අංශය විසින් ඉටුකරනු ලැබේ. මෙම අංශය පහත සඳහන් නිලධාරි මණ්ඩලයෙන් සමන්විත වේ.

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 02 |
| සහකාර ලේකම් | 08 |
| කළමනාකරණ සහකාර | 27 |

## 6.2.1 පත්කිරීම් හා උසස් කිරීම් අංශයෙහි කාර්යභාරය

පත්වීම් අංශයේ කාර්යභාරය පහත සඳහන් පරිදි ප්‍රධාන අංශ දෙකක් යටතේ සිදු කෙරේ.

### I. පත්කිරීම්

අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීම්/ උසස්කිරීම් පටිපාටි අනුව බඳවා ගැනීම, සේවයේ ස්ථිර කිරීම, සේවය අවසන් කිරීම, කලින් දැරූ තනතුරට පෙරළා යැවීම, වැඩබැලීමේ/ රාජකාරි ඉටු කිරීමේ පදනම මත පත්කිරීම, මුදාහැරීම (ස්ථිර/ තාවකාලික), සේවා ව්‍යවස්ථාවන්හි උප ලේඛනගත තනතුරුවලට (අදාළ අවස්ථාවන්හිදී) පත්කිරීම, කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම, සේවයෙන් ඉල්ලා අස්වීම, සේවයට/ තනතුරට නැවත පත්කිරීම, විශ්‍රාම ගැන්වීම (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88 අනුව, වෛකල්පිත/ අනිවාර්ය/ වෛද්‍ය හේතුන් පදනම මත), විශ්‍රාම ගිය රාජ්‍ය නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ස්ථානමාරු පරිපාටි වලින් බැහැරව කරනු ලබන ස්ථානමාරු කිරීම.

### II. උසස් කිරීම්

අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීම් පරිපාටි අනුව උසස් කිරීම, තනතුරු වලට පත් කිරීම. (ජ්‍යෙෂ්ඨතාවය මත, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල වලට අනුව)

ඉහත සඳහන් කර්තව්‍යයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබ ඇති නියෝග/ තීරණවලට එරෙහිව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියෙහි පවරා ඇති නඩු හා ශ්‍රේෂ්ඨාධිකරණයෙහි හා අභියාචනාධිකරණයෙහි ගොනුකර ඇති අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.

### 6.2.2 රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක නොවූ 2011-01-01 දින සිට 2011-05-12 දින දක්වා කාලය තුළ ඉටු කරන ලද කාර්යභාරය


2011.01.01 දින සිට 2011.12.31 දින දක්වා ශ්‍රේෂ්ඨාධිකරණ නඩු, අභියාචනාධිකරණ නඩු හා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත්ව තිබූ පෙත්සම්/ අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණයන්ට පාදක වී තිබූ කරුණු පිළිබඳව වාර්තා කිරීම හා අදාළ ලිපි ලේඛණ ඉදිරිපත් කිරීමත්, එම නඩු පිළිබඳ අවශ්‍ය අවස්ථාවල නීතිපති දෙපාර්තමේන්තුවේ සාකච්ඡා වලට සහභාගි වීමත් , පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය ඉදිරියේ පැවති පරීක්ෂණ වලට සහභාගි වීමත් මෙම කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් විසින් ඉටු කරන ලදි.

| | | |
|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණ නඩු | - | 26 |
| අභියාචනාධිකරණ නඩු | - | 08 |
| පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාර නඩු | - | 14 |

### 6.2.3 රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක වූ 2011-05-13 දින සිට 2011-12-31 දින දක්වා කාලය තුළ ප්‍රගති සමාලෝචනය

| | කාරණය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | විශ්‍රාම ගැන්වීම් | 868 |
| 2 | ස්ථිර කිරීම් | 632 |
| 3 | බඳවා ගැනීම් | 1571 |
| 4 | උසස් කිරීම් | 1804 |
| 5 | නැවත පත් කිරීම් | 1 |
| 6 | කාර්යක්ෂමතා කඩඉම් නිදහස් කිරීම් | 58 |
| 7 | වැඩ බැලීමට පත් කිරීම් | 220 |
| 8 | ස්ථිරව මුදාහැරීම් | 71 |
| 9 | තාවකාලික මුදාහැරීම් | 19 |
| 10 | නැවත සේවයේ පිහිටුවීම් | 106 |
| 11 | සේවා දීර්ඝ කිරීම් | 2466 |
| 12 | තනතුරු වලට පත් කිරීම් | 106 |
| 13 | **එකතුව** | **7922** |

වගුව අංක 02




රූප සටහන අංක 02

## 6.2.4 කාර්යක්ෂම හා සඵලදායී සේවයක් සැපයීම වෙනුවෙන් ගනු ලැබූ නව ක්‍රියා මාර්ග

- පෙර පැවති ක්‍රමය වන අමාත්‍යාංශ වලට අනුව රාජකාරි බෙදා හැරීම වෙනුවට විෂයන්ට අනුව මෙම අංශයේ රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් කණ්ඩායම් වලට වෙන්කර, එම එක් එක් කණ්ඩායමට අදාළ රාජකාරි පවරන ලද අතර එමඟින්, ඔවුන්ට පැවරී ඇති විෂය පිළිබඳ මනා අවබෝධයක් ලැබීම හේතු කොට ගෙන අංශයේ රාජකාරී කටයුතු කාර්යක්ෂමතාවයෙන් යුතුව ඉටුකිරීමේ හැකියාව ලැබීම.
- එදිනෙදා ඉදිරිපත්වන විෂය කරුණු පිළිබඳව කොමිෂන් සභාව වෙත තීරණ ගැනීම සඳහා ඉදිරිපත් කිරීම පිණිස පොදු ආකෘතියක් හඳුන්වා දීම මඟින් අදාල ලිපි ගොනු මාණ්ඩලික නිලධාරීන්ට කොමිෂන් සභාව වෙත නිරවුල්ව සහ ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීමට හැකියාවක් ලැබීම.
- එදිනෙදා ඉදිරිපත්වන විෂය කරුණු සඳහා සම්මත ආකෘති පත්‍ර හඳුන්වා දීම මඟින් එකම කරුණකට අදාලව ඉදිරිපත් කරන නිලධාරීන් කිහිප දෙනෙකු සම්බන්ධ ඉල්ලීම් එකවර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට හැකිවීමෙන් ප්‍රමාදය අවම වීම.

- බඳවා ගැනීම් හා උසස් කිරීම් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඉල්ලා ඇති අවස්ථා වල අදාළ බලධාරීන් විසින් නිවැරදි හා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා ඇතිවන අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා, අදාළ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු නිලධාරීන් සමඟ සාකච්ඡා කර ගැටළු හඳුනාගෙන අවශ්‍ය හා නිවැරදි ලිපි ලේඛන සමඟ විධිමත් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ඔවුන් දැනුවත් කිරීම මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ කඩිනමින් ලබා දීමට හැකි වීම.

- එකිනෙකට සමාන කාරණා වෙන් වෙන්ව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමේදී ඇතිවන ප්‍රමාදයන් අවම කර ගැනීම සඳහා එවැනි කරුණු 07 ක් සම්බන්ධයෙන් නව ආකෘති පත්‍ර හඳුන්වා දීම.

- කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් වන විවිධ ඉල්ලීම් සඳහා අවශ්‍ය ලිපි ලේඛණ නොමැතිව නිර්දේශ ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය කර ඇති මෙම අංශය, අදාළ ආයතන තම නිර්දේශයන් ( ඉහත සඳහන් කරුණු 07 හැර ) ඉදිරිපත් කිරීමේදී අඩුපාඩු ඇති නොවන පරිදි හා අවශ්‍ය ලේඛණ නිවැරදිව ගෙන්වා ගැනීම සඳහා ඒ ඒ විෂයන්ට අදාළව පිරික්සුම් ලැයිස්තු ද සකසමින් පවතී.

- පත් කිරීම්, උසස් කිරීම් සම්බන්ධයෙන් විධිමත් පත්වීම් ලිපි නිකුත් කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ වෙතින් එම ලිපි සකස් කර එවන තෙක් සිටිය යුතු වීම නිසා ඇතිව තිබූ ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා අදාළ ලිපි නිකුත් කිරීමට අවශ්‍ය තොරතුරු අමාත්‍යාංශ වලින් ලබා ගෙන, සනාථ කර ගැනීමෙන් පසුව , විධිමත් පත්කිරීම් හා උසස් වීම් ලිපි ශාඛාවෙන් ම සකස් කර නිකුත් කිරීමට කටයුතු කිරීම.

## 6.3 විනය අංශය

මධ්‍යම රජයට අයත් මාණ්ඩලික නිලධරයන් සම්බන්ධව ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ පළමු වන උප ලේඛනයෙහි සඳහන් වැරදිවලට අදාළ විනය පාලන බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කර ඇත. මීට අමතරව, රජයේ නිලධාරින් සම්බන්ධව, ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ දෙවන උප ලේඛනයෙහි සඳහන් වැරදිවලට අදාල විනය පාලනය සම්බන්ධ අභියාචන බලධරයා ලෙස ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව කටයුතු කරයි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ඉහත කී බලතල ප්‍රකාරව ඒ ඒ අවස්ථාවන්හිදී අවශ්‍ය නියෝග ලබා දීම සඳහා විනය අංශය කොමිෂන් සභාවට

නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කරමින් අවශ්‍ය සහයෝගය ලබා දෙයි. මෙම අංශය පහත සඳහන් කාර්ය මණ්ඩලයෙන් සමන්විත වේ

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 01 |
| සහකාර ලේකම් | 03 |
| කළමනාකරණ සහකාර | 15 |

## 6.3.1 විනය අංශයෙහි කාර්යභාරය

දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් හෝ අමාත්‍යාංශ ලේකම්වරුන් මගින් සිදු කරනු ලබන මූලික විමර්ශන වලට අදාළව මධ්‍යම රජයට අයත් සියලුම මාණ්ඩලික නිලධාරින්ගේ විනය කටයුතු මෙම අංශය මගින් සිදු කරනු ලැබේ. මූලික විමර්ශන වාර්තාවක් විනය අංශයට ලැබීමෙන් අනතුරුව එය පිළිබඳව නිසි අධ්‍යයනයක් සිදු කොට අදාළ නිරීක්ෂණ සම්පූර්ණ කරගැනීමෙන් පසුව වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව චෝදනා පත්‍ර නිකුත් කිරීම හෝ නොකිරීම පිළිබඳ සුදුසු තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත. චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට තීරණය කළහොත් එම චෝදනා පත්‍රය අදාල නිලධාරියාට අමාත්‍යාංශ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් භාර දීමට කටයුතු කරනු ලබන අතර එම චෝදනා පත්‍රයට චූදිත නිලධාරියා විසින් ඉදිරිපත් කරනු ලබන පිළිතුර සහ ඒ සම්බන්ධව අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහ අමාත්‍යාංශ ලේකම්ගේ නිරීක්ෂණ හා නිර්දේශ සැලකිල්ලට ගනිමින් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ තීරණයක් ගනු ඇත.

විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කළහොත් ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන පරීක්ෂණ නිලධාරීන්ගේ සංචිතයෙන් සුදුසු නිලධාරියෙකු පරික්ෂණ නිලධාරී ලෙස පත්කර එම විධිමත් විනය පරීක්ෂණය සිදු කරන ලෙස නියම කරනු ලැබේ. යම් හෙයකින් විධිමත් විනය පරීක්ෂණයක් නොපැවැත්වීමට තීරණය කළහොත් චූදිත නිලධාරියා විසින් ඉදිරිපත් කර ඇති පිළිතුර හා ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහ අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ නිරීක්ෂණ හා නිර්දේශ පදනම් කර ගනිමින් චූදිත නිලධාරියා සියලු චෝදනාවලින් නිදහස් කිරීම හෝ සුදුසු දඬුවමක් පැනවීම හෝ සිදු කරනු ලබයි.

විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වුණි නම් එම පරීක්ෂණ වාර්තාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලැබුණ පසු එම විධිමත් විනය පරීක්ෂණයේ දී ඉදිරිපත් වූ සියලුම වාචික හා ලිඛිත සාක්ෂි සැලකිල්ලට ගනිමින් චූදිත නිලධාරියා සියලු චෝදනාවලින් නිදහස් කිරීම හෝ

චෝදනා එකකට, කිහිපයකට හෝ සියල්ලට වරදකරු කොට සුදුසු විනය නියෝගයක් කොමිෂන් සභාව විසින් පනවනු ලැබේ.

තවද විනය ක්‍රියාපටිපාටියේ කොටසක් වශයෙන් කිසියම් චූදිත නිලධාරියෙක් වැඩ තහනමට ලක් කිරීම හෝ එවැනි වැඩ තහනමේ පසුවන නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවීම හෝ අනිවාර්ය නිවාඩු මත තැබීම හෝ නොනිමි විනය කරුණු පවතිද්දී අදාළ නිලධාරියා විශ්‍රාම ගන්වන්නේ නම් එකී විශ්‍රාම ගැන්වීම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තියට යටත් කිරීම හෝ සිදු කරනු ලැබේ.

ඉහත සඳහන් කටයුතුවලට අමතරව සේවය අත්හැරයාමේ නියෝගයට එරෙහිව මාණ්ඩලික නිලධාරින් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සැලකිල්ලට ගෙන එකී නිලධාරීන් සුදුසු පරිදි නැවත සේවයේ පිහිටුවීම/ නොපිහිටුවීම ද සිදු කරනු ලැබේ.

තවද, කොමිෂන් සභාව විසින් පනවනු ලබන විනය නියෝගවලට හෝ එවැනි විනය කටයුතු පිළිබඳ තීරණයන්ට එරෙහිව උපරිමාධිකරණ සහ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා ද මානව හිමිකම් කොමිසම, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව සහ ඔම්බුඩ්ස්මන් වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා ද සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කරනු ලැබේ.

විනය අංශය වෙත ලැබෙන සියළුම ලිපිලේඛන පිළිබඳව සවිස්තරාත්මකව කරුණු අධ්‍යයනය කර අපක්ෂපාතී තීරණ ගැනීම සඳහා නිරවුල්ව, එම කරුණු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම විනය අංශයේ කාර්ය භාරය වේ.

### 6.3.2 රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක නොවූ 2011-01-01 දින සිට 2011-05-12 දින දක්වා කාලය තුළ ඉටු කරන ලද කාර්යයන්


2011.01.01 දින සිට 2011.05.12 දින දක්වා ශ්‍රේෂ්ඨාධිකරණ නඩු, අභියාචනාධිකරණ නඩු හා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාර නඩු සම්බන්ධයෙන් අවශ්‍ය ලියවිලි අධ්‍යයනය කර පහත සඳහන් පරිදි එම නඩු සඳහා පෙනී සිටින ලදි.

| | |
|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණ නඩු - | 05 |
| අභියාචනාධිකරණ නඩු - | 07 |
| පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාර නඩු - | 08 |

### 6.3.3 රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක වූ 2011-05-13දින සිට 2011-12-31 දින දක්වා කාලය තුළ ප්‍රගති සමාලෝචනය

| | කාරණය | නියෝග ගණන |
|---|---|---|
| 1 | චෝදනා පත්‍ර නිකුත් කිරීම | 15 |
| 2 | චෝදනා පත්‍ර සංශෝධනය කිරීම | 7 |
| 3 | චෝදනා වලින් නිදහස් කිරීම | 16 |
| 4 | සේවයෙන් පහ කිරීම | 5 |
| 5 | අනෙකුත් දඬුවම් නියෝග | 61 |
| 6 | නැවත සේවයේ පිහිටුවීම | 19 |
| 7 | අභියාචනා ප්‍රතික්ෂේප කිරීම | 09 |
| 8 | වි.වැ සංග්‍රහයේ 12 වැනි වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම | 18 |
| 9 | අනිවාර්ය නිවාඩු ගැන්වීම | 6 |
| 10 | වැඩ තහනම් කිරීම | 24 |
| 11 | විනය පරීක්ෂණ නිලධාරීන් පත්කිරීම | 93 |
| 12 | විනය හේතු මත විශ්‍රාම ගැන්වීම් සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමක් බවට පරිවර්තනය කිරීම | 02 |
| 13 | සේවයෙන් විශ්‍රාම ගැන්වීම | 2 |
| 14 | අනෙකුත් සාමාන්‍ය නියෝග | 28 |
| | **එකතුව** | **305** |

වගුව අංක 03




රූප සටහන අංක 03

2011.05.13 දින සිට 2011.12.31 දින දක්වා ශ්‍රේෂ්ඨාධිකරණ නඩු, අභියාචනාධිකරණ නඩු හා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාර නඩු සම්බන්ධයෙන් අවශ්‍ය ලියවිලි අධ්‍යයනය කර පහත සඳහන් පරිදි එම නඩු සඳහා පෙනී සිටින ලදි.

| | | |
|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත් | - | 07 |
| අභියාචනාධිකරණ අයදුම්පත් | - | 06 |
| පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාර අභියාචනා | - | 22 |

## 6.3.4 කාර්යක්ෂම හා සඵලදායී සේවයක් සැපයීම වෙනුවෙන් ගනු ලැබූ නව ක්‍රියා මාර්ග

නව කොමිෂන් සභාව ස්ථාපිත කිරීමෙන් පසු මෙම අංශයේ ක්‍රියාකාරකම් වල කාර්යක්ෂමතාවය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින් (රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත) 2011.08.18 දින සිට පහත සඳහන් වෙනස්කම් සිදු කරන ලදි.

එතෙක් දීපව්‍යාප්ත සේවාවන්වල සහ එක් එක් අමාත්‍යාංශ යටතේ වූ මාණ්ඩලික නිලධාරීන්ගේ එක් විනය කටයුත්තකට අදාළ සියලුම කටයුතු ලිපි ගොනුව ආරම්භ කළ අවස්ථාවේ සිට ගොනුව අවසන් කරන අවස්ථාව දක්වා එක් මාණ්ඩලික නිලධාරියකු යටතේ එක් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරියකුට පැවරෙන සේ නිලධාරීන් අතරේ බෙදා වෙන්කර තිබූ ක්‍රමවේදය වෙනස් කරමින් අංශය විසින් ඉටුකරනු ලබන රාජකාරි කටයුතු මාණ්ඩලික නිලධාරීන් හා රා.කළ.ස.සේ නිලධාරීන් කණ්ඩායම් 05කට බෙදා ඔවුන්ට පවරන ලදී.

එක් රාජකාරි කටයුත්තක නිලධාරීන් නියැලීමෙන් ඔවුන් එම කටයුත්ත ඉටු කිරීමේ කාර්යක්ෂමතාවය හා නිවැරදිව කිරීමේ හැකියාව ඉහළ මට්ටමකට ගෙන ඒමට මෙමඟින් හැකි වූ අතර ලිපි ද්‍රව්‍ය භාවිතයේ අරපිරිමැස්මක් ද දක්නට ලැබුණි.

- විටින් විට ඇතිවන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සංශෝධනයන්ගෙන් පසුව තැපැල බෙදා වෙන්කිරීමේ දී ඇතිවන ගැටළුව මෙමඟින් මඟහැරී ඇත.

- කණ්ඩායම් හැඟීමෙන් යුතුව රාජකාරී ඉටු කිරීමට නිලධාරීන්ගේ හුරුවීමක් දක්නට ලැබුණි.

- රාජකාරි ස්වභාවය ඒකාකාරී වීම වැළැක්වීම සඳහා මාස 06කට වරක් කණ්ඩායම් අතර නිලධාරීන් මාරුකිරීමේ කටයුත්ත ද ආරම්භ කරන ලදි.

- මීට අමතරව මෙම අංශයේ ඇති සියලුම ලිපි ගොනු දත්ත පද්ධතියකට ඇතුළත් කරන ලද අතර කණ්ඩායම් අතර ලිපි ගොනු මාරු කිරීමේ දී අදාළ දත්තයන් යාවත්කාලීන කිරීමක් සිදු වේ. මෙමගින් ගොනුව පවතින්නේ කවරකු ළඟ ද යන්න කඩිනමින් සොයා ගැනීමට හැකියාවක් ඇත.

- එක් එක් අය විසින් ඉටු කරනු ලබන කාර්ය කොටස මැනවින් ඉටු කිරීමෙන් ලබන ප්‍රවීනත්වය හේතුවෙන් විනය කාර්ය කළමනාකරණය පහසු කිරීමට ද මෙම වැඩපිළිවෙළ හේතු වෙයි. ( උදා : චෝදනා පත්‍ර සකස් කිරීම නිවැරදිව හා සරලව සිදු කිරීම මගින් මීට පෙර සිදු වූ චෝදනාවල වැරදි සහගතභාවය මඟ හැර ගැනීමට මෙමගින් හැකිවී ඇත.)

## 6.4 අභියාචනා අංශය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 (1) අනුව්‍යවස්ථාව මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරනු ලැබ ඇති කමිටුවක් හෝ නිලධරයකු විසින් කරනු ලබන නියමයකින් අතෘප්තියට පත් යම් නිලධරයකුට එම නියමයන්ට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතිය ලබා දී ඇත.

එසේම 58 (2) අනුව්‍යවස්ථාව මගින් එවැනි අභියාචනයක් ලැබුණ විට ඒ පිළිබඳව කරුණු සොයා බලා එම නියමය අවලංගු කිරීමට හෝ වෙනස් කිරීමට හෝ ස්ථිර කිරීමට සුදුසු පරිදි කටයුතු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත්තේය. මෙම ප්‍රතිපාදනයන්ට අනුකූලව රජයේ නිලධරයන්ගෙන් අභියාචනා විශාල සංඛ්‍යාවක් කොමිෂන් සභාව වෙත නිරන්තරයෙන් ඉදිරිපත් වේ. එම අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කරන මෙම අංශය පහත සඳහන් කාර්ය මණ්ඩලයෙන් සමන්විත වේ.

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 01 |
| සහකාර ලේකම් | 02 |
| කළමනාකරණ සහකාර | 12 |

## 6.4.1 අභියාචනා අංශයෙහි කාර්යභාරය

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අභියාචන බලධාරියෙකු ලෙස කටයුතු කරනු ලබන විෂය පථය නිර්ණය කිරීමේදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ආ ව්‍යවස්ථාවේ සහ 155ඕ ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන් මඟින් බලපැවැත්වෙන පහත සඳහන් කර ඇති බලය අභිනියෝජනයන් සැලකිල්ලට ගත යුතුය.

- රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක 1295/26 දරණ 2003.07.02 දිනැති රජයේ (අතිවිශේෂ) ගැසට් නිවේදනයේ දක්වා ඇති රජයේ නිලධාරීන්ගේ පත්කිරීම්, උසස්කිරීම්, ස්ථානමාරු, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 වන ව්‍යවස්ථාව ප්‍රකාරව අභිනියෝජනය කර තිබීම.

- ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අංක 1449/12 දරණ 2006.06.13 දිනැති රජයේ (අතිවිශේෂ) ගැසට් නිවේදනයේ දක්වා ඇති පොලිස් නිලධාරීන්ගේ පත්කිරීම්, උසස්කිරීම්, ස්ථානමාරු, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඌ(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව අභිනියෝජනය කර තිබීම.

ඉහත සඳහන් බලය අභිනියෝජිත බලධාරියකුගේ නියමයකින් අතෘප්තියට පත් රාජ්‍ය නිලධාරියකුට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58(1) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව, ලිඛිත අභියාචනයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට අයිතියක් ඇති අතර, එසේ ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධව කටයුතු කිරීම අභියාචනා අංශය මගින් සිදු කෙරේ.

මීට අමතරව උක්ත කර්තව්‍යයන්ට අදාලව කොමිෂන් සභාවේ තීරණයකට එරෙහිව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය වෙත කරනු ලබන අභියාචනා සහ උපරිමාධිකරණයන් හි ගොනු කරනු ලබන නඩු අයදුම්පත් සම්බන්ධව කටයුතු කිරීමද මෙම අංශය මගින් සිදු කෙරේ.


## 6.4.2 රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක නොවූ 2011-01-01 දින සිට 2011-05-12 දින දක්වා කාලය තුළ ඉටු කරන ලද කාර්යයන්

ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය හා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය විසින් විමසන ලද තොරතුරු සම්බන්ධයෙන් ලිපි ගොනු ආශ්‍රයෙන් තොරතුරු සපයන ලදි.

### 6.4.3 රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක වූ 2011-05-13 දින සිට 2011-12-31 දින දක්වා කාලය තුළ ප්‍රගති සමාලෝචනය

| | කාරණය | පොලිස් දෙපාර්තමේන්තුවට අයත් අභියාචනා | වෙනත් අභියාචනා | එකතුව |
|---|---|---|---|---|
| 1 | වාර්තා ලැබී නොමැති අභියාචනා | 590 | 275 | 865 |
| 2 | වාර්තා ලැබී කටයුතු කෙරෙමින් පවතින අභියාචනා | 8 | 95 | 103 |
| 3 | කටයුතු නිම කළ අභියාචනා ගණන | 40 | 189 | 229 |
| 4 | දැනට පවතින අධිකරණ නඩු ගණන | 11 | 1 | 12 |
| 5 | දැනට පවතින පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරි නඩු ගණන | 2 | 13 | 15 |
| 6 | මහජන පෙත්සම් කාරක සභාවේ විමසීම් ගණන | 0 | 8 | 8 |
| 7 | එකතුව | 651 | 581 | 1232 |

වගුව අංක 04




රූප සටහන අංක 04

### 6.4.4 කාර්යක්ෂම හා සඵලදායී සේවයක් සැපයීම වෙනුවෙන් ගනු ලැබූ නව ක්‍රියා මාර්ග

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව, පොලිස් නිලධාරීන්ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථයට අදාළ රාජ්‍ය නිලධාරීන් ලෙස සලකනු ලැබීම හේතුකොටගෙන අභියාචනා අංශය වෙත ලැබෙන අභියාචනා ගණන සැලකිය යුතු ලෙස, ප්‍රමාණාත්මකව වැඩිවූ අතර, ප්‍රමාදයකින් තොරව එම අභියාචනා සඳහා කොමිෂන් සභා තීරණ ලබාදීමට අවශ්‍ය පියවර ගතයුතු විය.

ඒ අනුව,

- ලැබෙන අභියාචනා පිළිබඳ තොරතුරු පරිගණක ගතකර, එම දත්ත පරිගණක භාවිතයෙන් කළමනාකරණය කිරීමට අවශ්‍ය පියවර ගැනීම ආරම්භ කෙරිණි.

- අභියාචනා අංශයේ ලිපිගොනු කළමනාකරණය තවදුරටත් විධිමත් කරනු ලැබූ අතර, අභ්‍යන්තර රාජකාරි පැවරීම ඒ අනුව ප්‍රතිසංවිධානය කරන ලදි.

- අභියාචනා අංශයේ විෂය පථයට පරිබාහිරව ඉදිරිපත් වන කරුණු විශ්ලේෂණය කර ඒවා සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ග පූර්වගාමීව තීරණය කිරීම මගින් අදාළ නියමිත අභියාචනා සම්බන්ධව කටයුතු කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කරනු ලැබ ඇත.

- දැනට සිදුකරන ලද ප්‍රතිසංවිධානයන් වල යෝග්‍යතාවය සහ තවදුරටත් සිදුකළ යුතු වෙනස්කම් පිළිබඳව මසකට වරක් සිදුකරනු ලබන ප්‍රගති සමාලෝචනය මගින් හඳුනාගැනීමට කටයුතු කර ඇත.

- විෂය පථයට අදාළ කරුණු සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලයේ දැනුම වර්ධනය කිරීමට අවශ්‍ය මග පෙන්වීම් සිදුකරමින් පවතී.

- අභියාචනා ඉදිරිපත් කර ඇති නිලධාරීන් හට අවශ්‍ය තොරතුරු ලබාදීම විශේෂයෙන් බදාදා දිනයේදී සිදුකරනු ලබන අතර, එමගින් ඇතිවිය හැකි අනවබෝධය අවම කර ගැනීමට පියවර ගෙන ඇත.

## 6.5 පාලන අංශය

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ සාමාන්‍ය පරිපාලන කටයුතු පාලන අංශය වෙත පැවරී ඇත. අතිරේක ලේකම් (පාලන) මෙම අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි.

පාලන අංශය පහත සඳහන් කාර්යභාරය මෙහෙයවනු ලබයි :

- කොමිෂන් සභා කාර්යාලයේ සමස්ත පරිපාලනය
- කොමිෂන් සභා කාර්යාලයේ මානව සම්පත් කළමනාකරණය
- තොරතුරු කළමණාකරණ කටයුතු

මෙම අංශය පහත සඳහන් කාර්ය මණ්ඩලයෙන් සමන්විත වේ.

| | |
|---|---|
| අතිරේක ලේකම් | 01 |
| සහකාර ලේකම් | 01 |
| පරිපාලන නිලධාරි | 01 |
| භාෂා පරිවර්තක | 02 |
| කළමනාකරණ සහකාර | 11 |

## 6.6 ගිණුම් අංශය

මෙම අංශය කොමිෂන් සභා කාර්යාලය සඳහා නිර්බාධ මූල්‍ය තොරතුරු ප්‍රවාහයක් සහ කළමනාකරණ පද්ධතියක් සහතික වෙමින් මූල්‍යමය සේවා සපයයි. ඒ සඳහා පහත ක්‍රියාකාරකම් සපුරාලනු ලැබේ.

- කොමිෂන් සභා කාර්යාලය සඳහා මූල්‍ය සැළසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- භාණ්ඩ හා සේවා සැපයීම.
- ස්ථාවර වත්කම් කළමනාකරණය.
- මූල්‍යමය කරුණු සම්බන්ධව මාර්ගෝපදේශනය සහ උපදේශනය

- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වන ලේකම්වරයාට මූල්‍ය අංශයේ කටයුතු පිළිබඳව යාවත්කාලීන තොරතුරු සැපයීම.
- අංශ අතර මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය
- ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම

මෙම අංශය පහත සඳහන් කාර්ය මණ්ඩලයෙන් සමන්විත වේ.

| | |
|---|---|
| ගණකාධිකාරී | 01 |
| කළමනාකරණ සහකාර | 06 |

## 07. මුදල් ප්‍රතිපාදනය

2011.01.01 දින සිට 2011.12.31 දින දක්වා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ වියදම් සාරාංශය පහත පරිදි වේ.

| | ප්‍රතිපාදන | වියදම | ඉතිරිය |
|---|---|---|---|
| පුනරාවර්තන | 114615000.00 | 79,579,451.71 | 35,035,548.29 |
| ප්‍රාග්ධන | 11,280,000.00 | 7,986,693.74 | 3,293,306.26 |
| එකතුව | 125,895,000.00 | 87,566,145.45 | 38,328,854.55 |

වගුව අංක 05

## 08. කාර්ය මණ්ඩලය

### 8.1 සංවිධාන සටහන

සංවිධාන සටහන සඳහා **34** පිටුව බලන්න.

## 8.2 කාර්ය මණ්ඩලය

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සභාපති තුමා ඇතුළු සාමාජිකයන් 09 ද සමඟ නිලධාරින් 204 කින් සමන්විත වූ අතර එම කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය සත්‍ය වශයෙන්ම සේවයේ යොදවන ලද කාර්ය මණ්ඩලය 150 ක් (තනතුරු 54 ක් පුරප්පාඩුව පැවතීම නිසා) විය. එහි කාර්ය මණ්ඩලයේ සංයුතිය පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

<u>කාර්ය මණ්ඩල විස්තර</u>

| | |
|---|---|
| ලේකම් | **01** |
| අතිරේක ලේකම් | **02** |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | **04** |
| සහකාර ලේකම් | **22** |
| ගණකාධිකාරී | **01** |
| පරිපාලන නිලධාරී | **01** |
| භාෂා පරිවර්තක | **02** |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | **83** |
| රියදුරු සේවය | **12** |
| කාර්යාල සේවක සේවය | **<u>22</u>** |
| **එකතුව** | **<u>150</u>** |

## 8.3 කාර්ය මණ්ඩල පුහුණු කටයුතු

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන්ගේ විෂය දැනුම, භාෂා ප්‍රවීනතාවය, තාක්ෂණික දැනුම හා විශේෂ කලමනාකරණ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් වලට සහභාගී වීමේ අවස්ථාව 2011 වර්ෂය තුලද ආයතනය මගින් ලබා දීමට කටයුතු කර ඇත.

| ශ්‍රේණිය | පාඨමාලා වර්ගය | ආයතනය | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| මාණ්ඩලික නිලධාරීන් | දිගු කාලීන (විදේශ) | ඕස්ට්‍රේලියා ජාතික විශ්ව විද්‍යාලය,ඕස්ට්‍රේලියාව | 01 |
| මාණ්ඩලික නිලධාරීන් | කෙටි කාලීන (විදේශ) | සිවිල් සේවා විද්‍යායතනය, සිංගප්පූරුව | 01 |
| මාණ්ඩලික නිලධාරීන් | කෙටි කාලීන (විදේශ) | ලාල් බහදූර් ශාස්ත්‍රි පරිපාලනය පිළිබඳ ජාතික ඇකඩමිය. | 01 |
| මාණ්ඩලික නිලධාරීන් | කෙටි කාලීන (විදේශ) | සිංගප්පූරු සහයෝගිතා වැඩසටහන, සිංගප්පූරුව | 01 |
| මාණ්ඩලික නිලධාරීන් | දිගු කාලීන (දේශීය) | කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය | 01 |
| මාණ්ඩලික නිලධාරීන් | කෙටි කාලීන (දේශීය) | සංවර්ධන පරිපාලන ආයතනය | 05 |
| මාණ්ඩලික නිලධාරීන් | දිගු කාලීන (දේශීය) | සංවර්ධන පරිපාලන ආයතනය | 01 |
| කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් | කෙටි කාලීන (දේශීය) | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 83 |
| කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් | දිගු කාලීන (දේශීය) | මිලෝදා ආයතනය | 02 |
| සමස්ත කාර්ය මණ්ඩලය | දින ½ (දේශීය) | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | 150 |

වගුව අංක 06

## 09. 2011 වර්ෂය තුල එක් එක් අංශය විසින් කරුණු ඉදිරිපත් කර ඇති නඩු ගණන

| අංශය | ශ්‍රේෂ්ඨාධිකරණය | අභියාචනාධිකරණය | පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය |
|---|---|---|---|
| ආයතන | 02 | 00 | 03 |
| පත්වීම් | 26 | 08 | 14 |
| විනය | 12 | 13 | 30 |
| අභියාචනා | 09 | 3 | 15 |
| **එකතුව** | **49** | **24** | **62** |

වගුව අංක 07

## 10. කොමිෂන් සභා රැස්වීම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව නැවත ආරම්භ වූ 2011.05.19 දින සිට 2011.12.31 දින දක්වා වූ සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ කොමිෂන් සභා රැස්වීම් 71 ක් පවත්වා ඇත.

## 11. ස්තූතිය


සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉටුකරන ලද බොහෝ සුවිශේෂ කටයුතු වලදී සියලුම අමාත්‍යාංශ ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ද, විශේෂයෙන් ,

- ජනාධිපති ලේකම් කාර්යාලය
- අමාත්‍ය මණ්ඩල කාර්යාලය
- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
- ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
- තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය
- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමස්ථ කාර්ය මණ්ඩලය ද

දක්වනු ලැබූ අනුබලය හා දායකත්වය වෙනුවෙන් කොමිෂන් සභාවේ කෘතවේදීත්වය විශේෂයෙන් සනිටුහන් කළ යුතු වේ.

| | | |
|---|---|---|
| **විද්‍යාජෝති වෛද්‍ය දයාසිරි ප්‍රනාන්දු මහතා** | **සභාපති** | ……………………… |
| **ජනාධිපති නීතිඥ පාලිත එම්. කුමාරසිංහ මහතා** | **සාමාජික** | ……………………… |
| **සිරිමාවෝ ඒ. විජේරත්න මහත්මිය** | **සාමාජික** | ……………………… |
| **එස්.සී. මාන්නප්පෙරුම මහතා** | **සාමාජික** | ……………………… |
| **ආනන්ද සෙනවිරත්න මහතා** | **සාමාජික** | ……………………… |
| **එන්.එච්. පතිරණ මහතා** | **සාමාජික** | ……………………… |
| **එස්. තිල්ලෛයිනඩරාජා මහතා** | **සාමාජික** | ……………………… |
| **එම්.ඩී.ඩබ්ලිව්. ආරියවංශ මහතා** | **සාමාජික** | ……………………… |
| **ඒ. මොහොමඩ් නහියා මහතා** | **සාමාජික** | ……………………… |

## සංවිධාන සටහන
## රාජ්‍ය සේවා කොමිෂන් සභාව




**සටහන**

**ජ්‍යෙ.ස.ලේ.** - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්  **ස.ලේ.** - සහකාර ලේකම්

**ප.නි.** - පරිපාලන නිලධාරී  **තො.ස.තා.නි.** - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී

රූපසටහන අංක 05